الأخلاق في الإسلام ـ سنهالي

# ඉස්ලාම්හි

# යහපත් ගුණධර්ම

جمعية الدعوة بالزلفي


جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالزلفي

81

هاتف: ٤٢٣٤٤٦٦ ٠١٦ ـ فاكس: ٤٢٣٤٤٧٧ ٠١٦

# ඉස්ලාම්හි යහපත් ගුණධර්ම

## الأخلاق في الإسلام – اللغة السنهالية


جمعية الدعوة والإرشاد وتوعية الجاليات في الزلفي

Tel: 966 164234466 - Fax: 966 164234477

# الأخلاق في الإسلام

**أعده وترجمه إلى اللغة السنهالية:**

**جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالزلفي**

**الطبعة الرابعة: ١٤٤٢/٩ هـ**


**ح شعبة توعية الجاليات بالزلفي، ١٤٢١هـ**

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

شعبة توعية الجاليات بالزلفي

الأخلاق في الإسلام – الزلفي ، ١٤٢١ هـ

٣٢ ص؛ ١٢ × ١٧ سم

ردمك :٤-٩٢-٨١٣-٩٩٦٠

(النص باللغة السنهالية )

١ـ الأخلاق الإسلام          أ. العنوان

ديوي ٢١٢,٣          ٢١/١٤٧٦

**رقم الإيداع : ٢١/١٤٧٦**

**ردمك :٤-٩٢-٨١٣-٩٩٦٠**

# ඉස්ලාම්හි යහපත් ගුණාධර්ම

# පටුන

**විෂය** **පිටුව**


1-*යහපත් ගුණධර්මයෙහි සළකුණු* ........... *11*

2-*නබිතුමාගේ ගුණධර්ම* ................................ *13*

3-*සත්‍යභාවය* ..................................................... *16*

4-*භාරකාරත්වය* ................................................ *19*

5-*බැගෑපත්කම* .................................................. *20*

6-*ලැජ්ජාවීම* ..................................................... *21*

7-*අහපත් ගුණාංගයන්* .................................. *23*

8-*ගුණධර්මය වර්ධනය කිරීමේ මාර්ග* .. *29*

# الأخلاق في الإسلام
# ඉස්ලාම්හි යහපත් ගුණධර්ම

සියලු ප්‍රශංසා, ඉස්ලාම් ධර්මය අපහට දායාදයක් ලෙස ලබාදුන්, යහපත් ගුණධර්මයන් අපහට පෙන්වා දුන් හා ඒ වෙනුවෙන් උතුම් දායාදයන් පිළියෙල කළ අල්ලාහ්ටම හිමි වේ. අල්ලාහ්ගේ ආශීර්වාදය හා කරුණාව ඔහුගේ දූතයාවූ නබි මුහම්මදු (සල්) තුමානටද, එතුමාගේ පවුල් ඥාතීන් හා අනුගාමිකයින් ඇතුළු සැම දෙනාටමද ලැබෙනු මැනවි.

යහපත් ගුණධර්මයන් නබිවරුන්ගේ හා යහපත්ශීලීන් ගේ ලක්ෂණයන්ය. මෙයින් මිනිසාගේ තරාතිරම උසස්වේ. අල්ලාහ් තම නබිවරයාවූ මුහම්මදු (සල්) තුමාව, ඔහු යහ පත් ගුණධර්මයන් අඩංගු ශ්‍රේෂඨයෙකු බව සඳහන් කරන වැකියක් මගින් මෙලෙස වර්ණනා කරන්නේය.

*තවද, (ඕ : නබිවරයාණෙනි) නියත වශයෙන්ම, ඔබ ඉම හත් උතුම්වූ ගුණධර්ම ශීලයෙන් සිටින්නේය.*
*(අල්කුර්ආන්-68:4)*

යහපත් ගුණාධර්ම ආදරය හා ඇල්ම ඇති කරන අතර, අයහපත් ගුණාංග කෝපය හා ඊර්ෂ්‍යාව ඇති කරයි. කවරෙ කුගේ ගුණාංග යහපත් ශීලයෙන් පවතින්නේද, ඔහුට එය මෙලොවේ හා පරලොවේ

පලය ලබා දෙයි. ඔහුට අල්ලාහ් යහපත් ගුණධර්මය හා බිය භක්තිය එකතුකර ලබා දෙයි. මේ පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පව සන්නේය.

මිනිසුන් ස්වර්ගයෙහි පිවිසීමට අධික හේතුන් ලෙස පව තින්නේ, අල්ලාහ් පිළිබඳ බිය භක්තිය හා යහපත් ගුණධර් මයන්ය.

*(ග්‍රන්ථ : තිර්මිදි හා හාකිම්)*

මුහුණේ ප්‍රබෝධයෙන් සිටීම, යහකර්මවල යෙදීම හා මිනිසුන්ට අවහිරව පවතින දේ ඉවත් කිරීම යනාදීන් සත් ගුණධර්ම යනුවෙන් හැඳින්වේ, මේවා යහපත් කියමන්, කෝපය වැළකීම, එය සැඟවීම, හා හිරිහැරයන් ඉවත් කිරීම වැනි මුස්ලිම්වරයෙක් අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු කරුණු සමග එකට පවතී. මුහම්මදු නබි (සල්) තුමා මෙසේ පවසන්නේය.

සත් ගුණධර්මයන් පරිපූර්ණ කිරීම සඳහා මම එවා ඇත්තෙමි.

*(ග්‍රන්ථ : අහ්මද්, බයිහකී හා හාකිම්)*

නබි මුහම්මදු (සල්) තුමානන් අබූහුරෛරා (රලි) තුමා අමතා ‘ඔබ යහපත් ගුණධර්මයන් පිළිපදින්න’ යනුවෙන් උපදෙස් කළ විට ඔහු ‘නබිතුමනී, යහපත් ගුණධර්ම යනු කුමක්ද ?’ යනුවෙන් ඇසීය. එවිට එතුමා ‘ඔබෙන් වෙන්වී සිටින්නන් එකතු කරන්න. ඔබට අපරාධය කළ

අයට සමාව ලබා දෙන්න. ඔබට නොදෙන අයට ඔබ ලබා දෙන්න' යනු වෙන් පැවැසීය.

*(ග්‍රන්ථය : බයිහකී)*

මුස්ලිම් සහෝදරයිනි, මෙම සත් ගුණධර්මයට ලැබෙන ඉමහත් පල ප්‍රයෝජනය හා උතුම් කුලිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න. නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

නියතව, මිනිසෙකු තම යහපත් ගුණාංග මගින් (දහවල් කාලයෙහි) උපවාසයේ යෙදූ හා (රාත්‍රී කාලයෙහි) සිටගෙන නැමදුමෙහි නිරතවූ අයගේ තරාතිරම ලබන්නේය.

*(ග්‍රන්ථය : අහ්මද්)*

නබිනායක මුහම්මදු (සල්) තුමා යහපත් ගුණධර්මය විශ්වාසයෙහි පරිපූරණත්වය බව නිශ්චය කරමින් මෙලෙස පවසන්නේය.

විශ්වාසීන් අතර පරිපූර්ණ විශ්වාස වන්නයා ඔවුන් අතර සිටින ගුණධර්මයෙන් යහපත් ශීලයායය.

*(ග්‍රන්ථය : අබූදාවූද්)*

නබිනායක මුහම්මිදු (සල්) තුමා තුමා පැවැසූ පහත සඳහන් වදන් අප අවධානයට ලක් කළ යුතුයි.

අල්ලාහ්ට මිනිසුන් අතර, ඉතා ප්‍රිය වන්නයා මිනිසුන්ට ප්‍රයෝජනය වන්නාය. අල්ලාහ්ට ක්‍රියාවන් අතර ඉතා ප්‍රිය ක්‍රියාව, මුස්ලිම්වරයෙක් සතුටු කිරීම හෝ ඔහුගේ දුෂ්කර තාවයන් ඉවත් කිරීම හෝ

ඔහුගේ ණයක් පියවීම හෝ ඔහුගේ කුසගින්න නිමකිරීම වේ. මුස්ලිම් සහෝදරයෙකු ගේ අවශ්‍යතාවය නිමිත්තෙන් මා ඔහු හා සමග පිටත්වීම දේවස්ථානයේ මාසයක් (ඉ:තිකාෆ්) රැඳී සිටීමට වඩා මාහට ඉතා ප්‍රියයෙකි.

*(ග්‍රන්ථය : තබරානි)*

මුස්ලිම් සොයුර, ඔබ පවසන කුමන කියමනක් සඳහා කුලිය තිබේද, එය ඔබට දානයෙකි. නබිනායක මුහම්මදු (සල්) තුමා මේ බව මෙසේ පවසන්නේය.

යහපත් කියමන්ද සදකාවකි. *(ග්‍රන්ථ : බුහාරි, මුස්ලිම්)*

මෙම යහපත් කියමන් වෙනුවෙන්ද උතුම් පල ප්‍රයෝජන ලැබේ. මෙය සිත්සතන සමීප කරයි. හදවතතුල ප්‍රියභාවය බිහිකර අසතුටුකම තුරන් කරයි. නබිතුමාගේ යහමග සත් ගුණධර්මයන් ඇති කරන බැවින්, මුහුණ දෙන හිරි හැරයන් ගැන ඉවසා සිටින ලෙසද උනන්දු කරන්නේය. එතුමා මෙසේද පවසන්නේය.

ඔබ කුමන ස්ථානයක සිටියත්, අල්ලාහ් කෙරෙහි බිය බැතිකමින් සිටින්න. යම් අකුසලක් සිදුවූ විගස කුසලක් කරන්න. එය එම අකුසල විනාශ කරයි. මිනිසුන් අතර විනීතව හැසිරෙන්න.

*(ග්‍රන්ථය : තිර්මිදී)*

සැම ස්ථානයේ හා සැම කාලයේ යහපත් ගුණධර්මයන් පිළිපැදීම මුස්ලිම්වරයාට අවශ්‍යවේ. එය

ඔහු ගමන් කරන සෑම මාර්ග සහ ස්ථානවල මිනිසුන් අතර ඔහුව ප්‍රියකර සමීප කිරීමට හේතු වේ. කෙනෙකු තම බිරිඳගේ මුඛයට කවන කෑම පිඩුවක් සඳහා පවා ඉස්ලාම් ධර්මයෙහි කුලිය ලැබෙන්නේය. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ දෙසූහ.

ඔබ කුමක් වියදම් කළද, එය දානයකි. කෙතරම්නම්, ඔබ ඔබගේ බිරඳගේ මුඛයට කවන කෑම පිඩුවක් පවාද දානයකි.

*(ග්‍රන්ථය : බුහාරි)*

ප්‍රියවන්තයිනි, සෑම විශ්වාසවන්තයින්ම සහෝදරයන්ය. තමාට කැමැති දේම තම සහෝදරයා කෙරෙහිම කැමැති වීම මුස්ලිම් වරයෙකුට අනිවාර්යවේ. ඔබ ඔබට කුමක් ප්‍රිය කරන්නේද ? යැයි සිතන්න. ඒ දේම ඔබ සහෝදරයාටත් ලබා දෙන්න. එසේම ඔබ අප්‍රිය කරන දේ ඔබ සහෝදරයා ගෙන්ද ඉවත් කරන්න. කවරෙක් අල්ලාහ් ස්වාමියා ලෙසද, ඉස්ලාමය ජීවන මග ලෙසද, නබිනායක මුහම්මදු (සල්) තුමා වක්තෘවරයා හා දූතයා ලෙසද පිළිගෙන සිටින්නේද, ඔහුව පහත්කමින් සැළකීමෙන් ඔබ වැළකී සිටින්න. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

තම මුස්ලිම් සහෝදරයාව පහත්කමින් සැළකීම මිනි සෙකුට අකුසල් සිදුවීමට ප්‍රමාණවත් වේ.

*(ග්‍රන්ථය : මුස්ලිම්)*

මුස්ලිම් සහෝදරයිනි යහපත් ගුණධර්ම පිළිපැදීම, සෑම අවස්ථාවන්හිම සරල ඇදහීමක් වශයෙන් හා පහසු මගක් ලෙස පවතී. නබිනායක මුහම්මදු (සල්) තුමා අබූ දර්දා (රලි) තුමාගෙන් 'ඇදහීම් අතර සරල හා ශරීරයට පහසු ඇදහීමක් ගැන මා ඔබට දැනුම් දෙන්නේද ?' යනුවෙන් විමසීය. එයට ඔහු 'එසේමයි නබිතුමනී, දැනුම් දෙන්න'යැයි කීය. එවිට නබිතුමා 'නිශ්ශබ්දයෙන් සිටින්න. සත් ගුණධර්මයන් පිළිපදින්න. ඔබට මෙවන් වෙනත් කාර්යයක් කළ නොහැක' යනුවෙන් පැවැසීය.

'සත් ගුණධර්ම මගින් දහවල්හි උපවාසයෙහි යෙදු හා රාත්‍රියෙහි සිටගෙන වන්දනාමානය කළ අයගේ තරාතිරම ලබන්නේය' යන නබිවදන්හි සඳහන් සේ, මුළු රාත්‍රියෙහිම වන්දනාමානය කළ හා දහවල්හි උපවාසයෙහි යෙදී සිටින විශ්වාසියෙකු ලබන කුලියට සමාන කුලියක් තම සත් ගුණ ධර්මයෙන් විශ්වාසියෙකු ලබයි. මේ අනුව එතුමාගේ අනු ගාමික අබූදර්දා (රලි) තුමා 'මුස්ලිම්වරයාගේ සත් ගුණාංග ඔහුව ස්වර්ගයට ප්‍රවිෂ්ට කරයි. එසේම, ඔහුගේ අයපත් ගුණාංග ඔහුව අපායයට ප්‍රවිෂ්ට කරයි' යැයි පවසන්නේය.

# යහපත් ගුණධර්මයෙහි සළකුණු

යහපත් ගුණධර්මයේ සළකුණු විවිධ ලක්ෂණවල එක්ව පවතී. ඒවා, කෙනෙකු අධික ලජ්ජා වන්නෙකු, හිරිහැර නොකරන්නෙකු, වැඩිවැඩියෙන් කුසල් කරන්නෙකු, සත්‍ය ප්‍රකාශ කරන්නෙකු, අඩුවෙන් කතාබහවල යෙදෙන්නෙකු, කුසල් ක්‍රියාවන් අධිකව කරන්නෙකු, අනවශ්‍ය කාර්යන් ගෙන් වැළකි සිටින්නෙකු, දෙමාපියන්හට උපකාර කරන් නෙකු, පවුල් ඥාතීන් සමග එක්ව ජීවත්වන්නෙකු, ඉවසීලි වන්තයෙකු, තුති පුදකරන්නෙකු, තෘප්තිමත් වන්තයෙකු, සිහිඳුකමෙන් සිටින්නෙකු, ශාන්තනීය වන්තයෙකු, කන්‍යා භාවය රැකී සිටින්නෙකු හා ආදර වන්තයෙකු ලෙස සිටිය යුතුයි. ඒ අතර, ශාප කරන්නකෙු හෝ දොස්පද කියන් නෙකු හෝ කේළාම් කියන්නෙකු හෝ අඩුපාඩු පතුරු වන්නෙකු හෝ සීඝ්‍ර වන්තයෙකු හෝ වෛරය කරන්නෙකු හෝ ලෝභ වන්තයෙකු හෝ ඊර්ශ්‍යා කරන්නෙකු හෝ ලෙස නොසිටිය යුතුයි.

මුහුණේ ප්‍රබෝධයෙන්ද, මද සිනහ වන්නෙකු ලෙසද සිටිය යුතුයි. අල්ලාහ් වෙනුවෙන් ආදරය කළ, ඔහු වෙනු වෙන් තෘප්තිමත්වී හා ඔහු වෙනුවෙන් අප්‍රියද කළ යුතුයි. යහපත්ශීල පුද්ගලයා මිනිසුන් කරන හිරිහැරයන් ගැන ඉවසීමෙන් සිටී. ඔවුන් වැරදි කරන අවස්ථාවල 'ඒ සඳහා කිසියම් කාරණාවක්

ඇති' යැයි සිතයි. ඔවුන්ගේ වැරදි හා අඩුපාඩු ගැන සමීක්ෂණය කිරීමෙන් වැළකී සිටීමට සම්පූර්ණයෙන් උනන්දු කරයි. කිසිඳු අවස්ථාවක හෝ විශ්වාසි යෙකු අයහපත් ගුණාංග ශීලයා ලෙස සිටීමට නොහැක.

යහපත් ගුණධර්මයන්හි වැදගත්කම හා එය පිළිපදින් -නන් ලබන උතුම් ප්‍රතිඵලය ගැන නබිතුමා කීප අවස්ථා වන්හි සඳහන්කර ඇත. උසාමා ඉබ්නු ෂරීක් (රලි) තුමා මෙසේ පවසන්නේය.

අපි නබිනායක මුහම්මදු (සල්) තුමා සමග අසුන්ගෙන සිටින කළ සමහර මිනිසුන් පැමිණ 'අල්ලාහ්ගේ දාසයන් අතර අල්ලාහ්ට ඉමහත් ප්‍රිය වන්නයා කවරෙක්ද ?' යනු වෙන් එතුමාගෙන් විමසූහ. එවිට එතුමා 'ඔවුනතර සිටින ගුණාංගයෙන් යහපත් ශීලයා අල්ලාහ්ට ඉමහත් ප්‍රිය වන්න යාය' යනුවෙන් පැවැසීය. *(ග්‍රන්ථය : තබරානි)*

නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් වදනක් අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

'ඔබලා අතර මාහට ඉතාමත් ප්‍රිය වන්නයා හා පරලො වෙහි මාහට ඉතා සමීපයෙන් අසුන් ගන්නා කවරෙකු බව මා ඔබලාට දැනුම් දෙන්නද ? යැයි නබිතුමා ඇසීය. එයට සහාබාවරුන් 'එසේමයි අපහට දැනුම් දෙන්න' යනුවෙන් කීහ. එකළ එතුමා 'ඔහු

ඔබලා අතර සිටින සත් ගුණධර්ම ශීලයාය' යනුවෙන් පැවැසීය. *(ග්‍රන්ථය : අහ්මද්)*

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේද පවසන්නේය.

පරලොව දිනයෙහි දාසයෙකුගේ තුලාවට සත් ගුණධර්ම යට වඩා බරවූ දෙයක් නොමැත.

*(ග්‍රන්ථය : අහ්මද්)*

# නබිතුමාගේ ගුණධර්ම

නබිනායක මුහම්මදු (සල්) තුමා තම අනුගාමිකයන් කුමන සත් ගුණධර්මයන් කරා කැඳවූයේද, එතුමා ඔවුන් අතර එම සත් ගුණ ධර්මයෙන්ම ආදර්ශමත්ව සිටියේය. එතුමා තම අනුගාමිකයින් අතර, තම දැනුම් ඥානය හා උපදෙස් මගින් (පමණක්) මෙවන් ගුණධර්මයන් නොවැපිරී ඒවා තම ජීවිතයෙහි පිළිපැදීම මගින් වැපුරුවාය. අනස් (රලි) තුමා මෙසේ පවසන්නේය.

මා නබි මුහම්මදු (සල්) තුමාට වසර දහයක කාලයක් සේවකයෙකු ලෙස සිටීමි. එතුමා මාහට කිසිඳු අවස්ථාවක හෝ 'චී' යනුවෙන් පිළිකුල් හඟවා නොකිව්වේය. කිසියම් කාර්යයක් ගැන ඇයි ඔබ මෙසේ කළේ ? ඇයි ඔබ මෙසේ නොකළේ ? යනුවෙන්ද නොඇසීය. *(ග්‍රන්ථය : මුස්ලිම්)*

මා නබිනායක මුහම්මදු (සල්) තුමා සමග ගමන් කර මින් සිටීමි. එතුමා මත මහත දාර(වාට්ටි)යෙන් යුත් පොරෝ නාවක් තිබින. ගම්වැසියෙකු පැමිණ එය තදෙන් ඇද්දේය. මා නබිතුමාගේ උරහිස කරා බැලුවෙමි. තදෙන් ඇදූ නිසා පොරෝනා දාරයෙහි ප්‍රතිබිම්බය එහි පැණින. පසුව, ඔහු ‘මුහම්මද්, ඔබ සතුව ඇති අල්ලාහ්ගේ සම්පත්වලින් මාහට නිකුත් කරන ලෙසට අණ කරන්න යනුවෙන් කීය. එකළ එතුමා ‘ඔහු කරා බලා සිනහවීමෙන් පසු ඔහුට එය නිකුත් කරන මෙන් අණ කළේය. *(ග්‍රන්ථය : බුහාරි)*

නබිතුමා තම නිවසෙහි කුමක් කරන්නේද ? යනුවෙන් එතුමාගේ බිරියෙක්වූ ආයිෂා (රලි) තුමියගෙන් විමසූ කළ, එතුමිය ‘එතුමා නිවැස් කටයුතුවලදී (තම බිරිඳන්ට) සහාය දක්වන්නේය. සලාතයේ වේලාව පැමිණ විගස දෝවනයකර සලාතය සඳහා පිටත්වන්නේය.

නබිතුමාගේ අනුගාමික අබ්දුල්ලාහ් ඉබ්නු හාරිද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමාට වඩා වැඩියෙන් මද සිනහ වන කිසියම් කෙනෙකු මා නොදිටිමි. *(ග්‍රන්ථය : තිර්මිදී)*

නබිතුමාගේ ප්‍රසිද්ධ ගුණාංගයන් අතර එතුමා ලෝභක මෙන් තොර දානය කිරීමෙහි යහපත් ශීලයාය. සත්‍යභාව යෙන් කිසිවිටක පසුබට නොවන

ධෛර්ය වන්තයාය. තීන්දු කිරීමේදී කිසි විටක හෝ අසාධාරණකම් නොකරන යුක්ති ගරුක පුද්ගලයාය. සිය ජීවිතයෙහිම සත්‍යශීලයා හා විශ් වාස වන්තයා ලෙස බැබලුවේය. එතුමාගෙන් කිසිඳු දෙයක් අයැද, එතුමා එය නොමැති බව කිසියම් දිනක නොපැවැසූ බව ජාබිර් (රලි) තුමා පවසන්නේය. *(ග්‍රන්ථය : බුහාරි)*

නබිතුමා තම අනුගාමිකයන් හා සමග යහළු විහිළුවෙහි යෙදී සිටින්නේය. ඔවුහු සමග එක්වමින් ඔවුන්ගේ දරුවන් සුරතල් කරමින් විනෝද කරන්නේය. දරුවන් තම ඔඩොක් කුවෙහි වාඩිකරවා ගන්නේය. ආගන්තුක සංග්‍රහ සඳහා කෙරෙන ආරාධනා පිළිගන්නෙකු ලෙසද, රෝගීන්ගේ සුව දුක් විමසන්නෙකු ලෙසද, මිනිසුන් තමන්ගේ වැරදීන් සඳහා පවසන නිදහසට කරුණු පිළිගන්නෙකු ලෙසද සිටියේය.

නබිතුමා තම අනුගාමිකයන්, ඔවුන් ප්‍රියවන නම්වලින් කැඳවන්නේය. තමා සමග කරන කවරෙකුගේ කතා බහ හෝ විසන්ධි නොකරන්නේය. එතුමාගේ අනුගාමිකයා වූ අබූ කතාදා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නබිතුමා හමුවීම සඳහා නජ්ජාසි රජතුමාගේ දූත පිරි සක් පැමිණි අවස්ථාවේදී එතුමා ඔවුන්ට ආවතේව කළේය. එවිට එතුමාගේ අනුගාමිකයෙක් 'ඔබතුමා වෙනුවෙන් (ආව -තේව කිරීමට අපි සිටින්නෙමු' යැයි කීහ. එයට එතුමා 'ඔවුන් අප සහෝදරයින්ට ගරු

කළුහ. එනිසා, මා ඔවුන්ට ආවතේව කිරීමට ප්‍රිය කරමි' යැයි පැවැසීය. පසුව, එතුමා 'මාද (අල්ලාහ්ගේ) දාසයෙකි. දාසයෙක් ආහාර පානය අනු -භව කරන සේම මාද ආහාර පානය අනුභව කරමි' යැයිද පැවැසීය. එතුමා බූරුවා මත ගමන් කරන්නේය. දිළින්දන් ගේ සුවදුක් විමසන අතර, ඔවුන් සමග එකට අසුන්ගෙන සිටින්නේය.

# සත්‍යභාවය

නියතව, සැබෑ මුස්ලිම් වරයා තම දෙවියා හා මිනිසුන් සැම දෙනා සමගද සත්‍යභාවයෙන් කටයුතු කරයි. එසේම, සැම අවස්ථාවල සිය ප්‍රකාශ හා ක්‍රියාවලදීද සත්‍යභාවයෙන් සිටී. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

විශ්වාස වන්තයිනි, අල්ලාහ් කෙරෙහි බියෙන් සිටින්න. තවද, සත්‍ය වන්තයන් සමග සිටින්න.

*(අල්කුර්ආන් -9:119)*

ආඉෂා (රලි) තුමිය මෙසේ පවසන්නීය.

අසත්‍යයට වඩා ඉමහත් පිළිකුල් ගුණාංගයක් මුහම්මදු නබි (සල්) තුමාට නොතිබින.

*(ග්‍රන්ථය : අහ්මද්)*

විශ්වාස වන්තයා බියගුල්ලා ලෙස සිටීද? යනුවෙන් නබි තුමාගෙන් ප්‍රශ්න කළුවිට එතුමා 'ඔව් සිටී' යනුවෙන්ද, විශ් -වාස වන්තයා ලෝභයා ලෙස සිටීද?

යනුවෙන් ප්‍රශ්න කළ විට එතුමා 'ඔව් සිටී' යනුවෙන්ද පැවැසූ අතර, විශ්වාස වන් −තයා අසත්‍ය වන්තයා ලෙස සිටීද ? යනුවෙන් ප්‍රශ්න කළ විට එතුමා 'නොසිටී' යනුවෙන්ද පැවැසීය. *(ග්‍රන්ථය : මුඅත්තා)*

ආගම පිළිබඳ කාර්යයන් අසත්‍ය කිරීම, අකුසල් අතරින් ඉතා පිළිකුල් කමක්ද, අසත්‍යයේ වර්ග අතර ඉතා දුෂ්ට කමක්දවේ. එයට කුලිය, අපායයවේ. මක්තිසාද යත්, නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

කවරෙකු මා ගැන ඕනෑකමින් අසත්‍යය පවසන්නේද, ඔහු තම අසුන (ස්ථානය) අපායයෙහි පිළියෙල කරත්වා. *(ග්‍රන්ථය : බුහාරි)*

දරුවන් සත් ගුණධර්මයෙහි වර්ධනයවීම සඳහා දරුවන් ගේ සිත් සතන් තුල එය වැපිරීමට ඉස්ලාම් දහම උනන්දු කරයි. නබිනායක තුමා පැවැසූ වදනක් අබූහුරෙරා (රලි) මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් හෝ දරුවෙක් අමතා 'එන්න මෙය රැගෙන යන්න' යනුවෙන් කැඳවා පසුව එය ලබා නොදෙන්නේනම්, එයද අසත්‍යයෙකි.

*(ග්‍රන්ථය : අහ්මද්)*

විනෝදයට වුවද අසත්‍යය කීමෙන් වැළකී සිටින ලෙසට නබිතුමා තම සමාජයන් උනන්දු කර සිටින අතර, විනෝ දයට හෝ අසත්‍යය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින්නාට ස්වර්ග මධ්‍යයේ මාලිගාවක් තනනු

ලබන බව පොරොන්දු වක්ද පළ කරයි. එතුමා මේ ගැන මෙසේ පවසන්නේය.

විනෝදයට හෝ වේවා, අසත්‍ය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින්නාට ස්වර්ග මාධ්‍යයෙහි මාලිගාවක් ලබා දීමට මම පොරොන්දු වෙමි. *(ග්‍රන්ථය : අබූදාවූද්)*

වෙළෙන්දා තම වෙළඳ භාණ්ඩ පිළිබඳව විවරණය කිරී මේදී අසත්‍ය පැවැසීමට ඉඩ ඇත. මේ ගැන නබි මුහම්මදු (සල්) තුමා මෙසේ අවවාද කරන්නේය.

භාණ්ඩයෙහි පවතින අඩුපාඩුකම් ගැන දැන ගෙනත්, එය නොපවසා විකිණීම කිසියම් මුස්ලිම්වරයෙකුට හෝ අනුමත නොවන්නේය.
*(ග්‍රන්ථය : බුහාරි)*

# වගකීම්

විශ්වාසය සඳහා පවරන ලද වගකීම් නිසි පරිදි රකින ලෙසත්, මිනිසා තමා ඉටු කරන කාර්යයන් ලොකු හෝ කුඩා හෝ වේවා ඒවා සියල්ලෙහි තම දෙවියා තමා කෙරෙහි අවධානය යොමුකර සිටින බව සිතා ක්‍රියා කළ යුතු බවත් ඉස්ලාම් ධර්මය, අණ කරයි. එහෙයින්, මුස්ලිම් වරයෙකු තමාට අල්ලාහ් නියමකර ඇති කාර්යයන් ඉටු කිරීමෙහි හා මිනිසුන් අතර පවතින හැසිරීමෙහි (එනම් තමාට පවරන ලද වගකීම් කෙරෙහි) විශ්වාසභාවයෙන් සිටිය යුතුයි. වග කීම් යනු, මිනිසා තමාට පවරන ලද කාර්යයන් පරිපූර්ණ

යෙන් ඉටු කිරීමට උනන්දු වීමකි. මෙය අල්ලාහ් මෙලෙස පවසන්නේය.

ඔබලා වෙත භාරකරන ලද දේ එහි හිමිකරුවන්ට භාර කරන ලෙසත්, මිනිසුන් අතර තීන්දු කරන්නේ නම්, යුතු කමින් තීන්දු කරන ලෙසත් නියතව අල්ලාහ් ඔබලාට අණ කරන්නේය. *(අල්කුර්ආන්-4:58)*

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

වගකීම් පිළිබඳ විශ්වාසනීය භාවයක් නොවන්නාට විශ් වාසය (ඊමාන්) නොවන්නේය. *(ග්‍රන්ථය : අහ්මද්)*

වගකීම් පිළිබඳ විශ්වාස භාවය යනු, සමහරුන් දැන සිටින පරිදි තමා වෙත භාරකරන ලද භාණ්ඩ සුරකීම පම ණක් නොවන අතර, එය ඉතාමත් ගැඹුරු අර්ථ සහිතකි. වගකීම පිළිබඳ විශ්වාස භාවය ඉටුකිරීම යනු, තමා වෙත පවරන සෑම කාර්යයන් හා ක්‍රියාවන් එය මෙලෝ හෝ පරලෝ පිළිබඳ කරුණු හෝ වේවා එවා විශ්වාසයෙන් ඉටු කිරීමකි.

# බැගෑපත්කම

මුස්ලිම්වරයා තමා ඉතා පහත්කමෙන් තොර, බැගෑපත් කමෙන් ක්‍රියා කළ යුතුයි. කිසිඳු අවස්ථාවක හෝ අහංකාර කමෙන් නොසිටිය යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

තවද, (මු : නබි,) ඔබව පිළිපදින විශ්වාසීන් අතර, උර හිස පහත්කර (සිනිඳු කමින්) හැසිරෙන්න.
*(අල්කුර්ආන්-26:215)*

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

(رواه مسلم) [مَا تَوَاضَعَ أَحَدٌ لِلهِ إِلاَّ رَفَعَهُ]

අල්ලාහ් වෙනුවෙන් බැගෑපත්කමින් හැසිරෙන කිසිවෙ -කුව අල්ලාහ් උසස් නොකර නොසිටී.
*(ග්‍රන්ථය : මුස්ලිම්)*

[إِنَّ اللهَ أُوْحِيَ إِلَيَّ أَنْ تَوَاضَعُوْا حَتَّى لاَ يَفْخُرَ أَحَدٌ عَلَى أَحَدٍ، وَلاَ يَبْغى أَحَدٌ عَلَى اَحَدٍ] (رواه مسلم)

ඔබලාගෙන් කෙනෙකු තවත් කෙනෙකුට අහංකාර හා අපරාධ නොකරන තරමට බැගෑපත්කමින් හැසිරෙන ලෙස අල්ලාහ් මාහට (දේව හෙළිදරව්ව මගින්) දැනුම්දී ඇත. *(ග්‍රන්ථය : මුස්ලිම්)*

දිළින්දන් හා දුප්පතුන් සමග අසුන් ගැනීම, ඔවුන් අතර තමා ශ්‍රේෂ්ඨයා ලෙස නොපෙන්වීම, මිනිසුන් සමග මුහුණේ ප්‍රබෝධයෙන් සිටීම හා කෙනෙකු වෙනත් කෙනෙකුට වඩා ශ්‍රේෂ්ඨයා බව නොසිතීම යනාදීන් බැගෑපත්කමෙහි භාහිර ප්‍රතිරූපයන්ය.

නබි මුහම්මදු (සල්) තුමා සමාජයෙහි වක්තෘවරයා ලෙස සිට තම නිවස අතුගාමින්ද, එළුවන්ගෙන් කිරි

දොවමින්ද, ඉරුණු තම ඇඳුම් පැළඳුම් මසා ගනිමින්ද, තම ආවතේව කාරයා සමග (එකට වාඩිවී) ආහාර පානය අනුභව කර මින්ද, වෙළඳ පොළට ගොස් අවශ්‍ය දේ මිළදී ගනිමින්ද, කිසිදු භේදයකින් තොරව වැඩිහිටියන්, කුඩා අය, පොහොසත් හා දිළින්දන් සමග අතිනත ගෙන මුඛවර්ණනා කර මින්ද සිටියේය.

# ලැජ්ජාවීම

ලැජ්ජාවීම විශ්වාසයේ කොටසක්වන අතර, එය කුසල් වර්ධනය කරයි. මේ පිළිබඳව බුහාරි හා මුස්ලිම ග්‍රන්ථවල නබි මුහම්මදු (සල්) තුමාගේ වදනක් වාර්තාවේ. එතුමාගේ මෙවැනි විශිෂ්ඨ ගුණාංගයන් මුස්ලිම් වරුන්ට ආදර්ශමත්ව පවතී. මක්නිසාද යත්, නබිතුමා අධිකව ලැජ්ජා වන්නෙකු ලෙස සිටියේය.

අබූ සර්ද් (රලි) තුමා මෙසේ පවසන්නේය.

[...فَإِذَا رَأَى شَيْأً يُكْرِهُهُ عَرَفْنَاهُ فِيْ وَجْهِهِ] (رواه البخاري)

නබි (සල්) තුමා පිළිකුල් දෙයක් දුටුවේනම්, එතුමාගේ මුහුණයෙහිම ඒ බව අපි දැන ගනිමු.

*(ග්‍රන්ථය : බුහාරි)*

මුස්ලිම් වරයාගේ ලජ්ජාව සත්‍යය පැවැසීමට හෝ දැනුම් ඥානය ලබා ගැනීමට හෝ යහපත් කාර්යයන් කෙරෙහි අණ කිරීමට හෝ අයහපත් ක්‍රියාවන්ගෙන් වැළකී සිටීමට හෝ බාධාවන් ලෙස නොපවතී.

උම්මු සුලෙයිම් (රලි) තුමියගේ ලැජ්ජාව නබිනායක තුමා ගෙන් මෙසේ ඇසීමට බාධාවක් නොවීය. 'අල්ලාහ්ගේ දූතයා ණෙනි, සත්‍යය පැවැසීමට නිශ්චය වශයෙන්ම, අල්ලාහ් ලැජ්ජා නොවන්නේය. ස්ත්‍රියෙකුට සිහිනයෙහි ධාතුව පිටත් වූයේනම්, ඇයට ස්නානය කිරීම අනිවාර්යද ?' යනුවෙන් එතුමිය ඇසීය. එයට එතුමා 'ඔව් ඇය ධාතුව දුටුවේනම්, ජල ස්නානය කිරීම අනිවාර්ය වේ' යනුවෙන් පැවැසීය. *(ග්‍රන්ථය : බුහාරි)*

එසේම, ලැජ්ජාවීම, අකුසල් කාර්යවල යෙදීම, තමාට පැවැරු කාර්යයන් අඩාල කිරීම, මිනිසුන්ගේ රහසයන් එළි කිරීම හා ඔවුන්ට පීඩා කිරීම යනාදි කාර්යයන් වළක්වයි.

අල්ලාහ් වෙනුවෙන් ලජ්ජාවීම ඉතා උතුම්ය. එනිසා, විශ්වාස වන්තයා තමා මැවූ දෙවියාට ලැජ්ජා විය යුතුයි. ඔහු ඔහුව මවා ඔහුට දායාදයන් ලබා දුන්නේය. එනිසා ඔහුට වහල් වීමෙන්ද, ඔහුගේ දායාදයන් වෙනුවෙන් තුති පුදකිරීමෙන්ද අඩුපාඩු කිරී මට මුස්ලිම් වරයා ලැජ්ජාවිය යුතුයි. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

**[فَاللهُ أَحَقُّ أَنْ يَسْتَحْيَامِنْهُ مِنَ النَّاسِ]** (رواه البخاري)

මිනිසුන්ට වඩා ලජ්ජාවීමට අල්ලාහ් තමා ඉතාමත් සුදුස්සාය. *(ග්‍රන්ථය : බුහාරි)*

# අයහපත් ගුණාංගයන්

## අපරාධ කිරීම

සත්‍ය මුස්ලිම් වරයාගෙන් කිසියම් කෙනෙකුට හෝ නින්දා කිරීම නොසිදුවේ. ඉස්ලාමය අපරාධ කිරීම තහනම් කරයි. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَمَنْ يَظْلِمْ مِنْكُمْ نُذِقْهُ عَذَابًا كَبِيرًا﴾ [الفرقان:١٩]

තවද, ඔබලා අතර, කවරෙකු අපරාධ කරමින් සිටින්නේද, අපි ඔහුට විශාල වේදනාවක් (භුක්ති විඳීමට) ඇති කරන්නෙමු. *(අල්කුර්ආන්-25:19)*

හදීස් කුදුස්හි අල්ලාහ් පැවැසූ බව මෙසේ වාර්තාවේ.

[إِنِّي حَرَّمْتُ الظُّلْمَ عَلَى نَفْسِي وَجَعَلْتُهُ بَيْنَكُمْ مُحَرَّمًا فَلاَ تَظَالَمُوْا] (رواه مسلم)

මාගේ දාසයිනි, අපරාධය මා මාහට තහනම් කළෙමි. එය ඔබලා අතරද තහනම් ලෙසට පත් කළෙමි. එනිසා, ඔබලා කිසි යම් කෙනෙකුට හෝ අපරාධ නොකරන්න. *(ග්‍රන්ථය : මුස්ලිම්)*

## අපරාධය වර්ග තුනකට බෙදේ. ඒවා මෙසේය.

## 1-දෙවියාට කරන අපරාධය

දාසයා තම දෙවියාට කරන අපරාධය ඔහුව ප්‍රතික්ෂේප කිරී මෙන් සිදුවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَالْكَافِرُوْنَ هُمُ الظَّالِمُوْنَ﴾ [البقرة:٢٥٤]

ප්‍රතික්ෂේප කරන්නන් හෙතම අපරාධ කරුවන්ය. *(අල්කුර්ආන්-2:254)*

සමහර ඇදහීමයන් අල්ලාහ් හැර වෙනත් කෙනෙකුට යොමු කිරීම සේම, ඔහුගේ ඇදහීමයන්හි සමාන කිරීමෙන්ද මෙය සිදුවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ إِنَّ الشِّرْكَ لَظُلْمٌ عَظِيْمٌ﴾ [لقمان :١٣]

නියත වශයෙන්ම, අල්ලාහ්ට සමාන කිරීම ඉමහත් අපරාධ යෙකි. *(අල්කුර්ආන්-31:13)*

## 2-මිනිසාට කරන අපරාධය

මිනිසා අන් මිනිසාට කරන අපරාධය ඔවුන්ගේ නම්බුව, ශරී රය හා ධනයන් කෙරෙහි අක්‍රමවත් ලෙස හානි ඇති කිරී මෙන් සිදුවේ. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[كُلُّ الْمُسْلِمِ عَلَى الْمُسْلِمِ حَرَامٌ : دَمُهُ، وَمَالُهُ، وَعِرْضُهُ] (رواه البخاري)

සෑම මුස්ලිම් වරයාගේම ප්‍රාණය, සම්පත හා නම්බුව වෙනත් මුස්ලිම් වරයාට තහනමිය. *(ග්‍රන්ථය : බුහාරි)*

[مَنْ كَانَ عِنْدَهُ مَظْلَمَةٌ لأَخِيْهِ مِنْ عِرْضٍ أَوْ شَيْءٍ فَلْيَتَحَلَّلْهُ مِنْهُ الْيَوْمَ مِنْ قَبْلِ أَنْ لاَ يَكُوْنَ دِيْنَارٌ وَلاَ دِرْهَمٌ ، إِنْ كَانَ لَهُ عَمَلٌ صَالِحٌ أُخِذَ مِنْهُ بِقَدْرِ مَظْلَمَتِهِ ، وَإِنْ لَمْ يَكُنْ لَهُ حَسَنَاتٌ أُخِذَ مِنْ سَيِّئَاتِ صَاحِبِهِ فَحُمِلَ عَلَيْهِ] (رواه البخاري)

කවරෙකු හෝ තම සහෝදරයාව අවනම්බුවට පත්කර හෝ කිසියම් දෙයක් පැහැර ගෙන හෝ අපරාධ කළේද, දීනාර් හා දිර්හම් (කිසිවෙකු) පල නොදෙන දිනය පැමිණීමට පෙර ඔහු එම අපරාධයෙන් නිදහස්වී සිටිය යුතුයි. ඔහු සතුව කුසල් තිබේනම්. ඔහු කළ අපරාධයෙහි ප්‍රමාණයට එයින් ගැනෙනු ලැබේ. ඔහු සතුව කුසල් නොවන්නේනම්. ඔහු මගින් අපරාධයට ලක්වූ තැනැත්තාගේ අකුසල් ඔහු මත පටවනු ලැබේ.

*(ග්‍රන්ථය : බුහාරි)*

## 3-සිය ආත්මයට කරන අපරාධය

මිනිසා තමාගේ ආත්මයට කරන අපරාධය, තහනම් කාරය යන්හි යෙදීමෙන් සිදුවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَمَا ظَلَمُوْنَا وَلَكِنْ كَانُوْا أَنْفُسَهُمْ يَظْلِمُوْنَ﴾ [البقرة:٥٧]

තවද, ඔවුන් අපහට අපරාධ නොකළහ. නමුදු, ඔවුන් තම ආත්මයටම අපරාධ කරමින් සිටියහ.

*(අල්කුර්ආන්-2:57)*

තහනම් දේහි යෙදීම තම ආත්මයටම කරන අපරාධයෙකි. මන්ද, මෙසේ යෙදීම අල්ලාහ්ගේ දඬුවම අනිවාර්ය කරයි.

# ඊර්ෂ්‍යා කිරීම

මුස්ලිම්වරයා වැළකී සිටීමට අනිවාර්යවූ නින්දිත ගුණාංග යන් අතර ඊර්ෂ්‍යා කිරීමද එකකි. මක්නිසාදයත්, අල්ලාහ් තම දාසයන්ට බෙදා ඇති දේ කෙරෙහි ප්‍රතික්ෂේප කිරීම මෙහි සිදු වන්නේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿أَمْ يَحْسُدُوْنَ النَّاسَ عَلَى مَا آتَاهُمُ اللهُ مِنْ فَضْلِهِ﴾ [النساء: ٥٤]

අල්ලාහ් මිනිසුන්ට ලබාදී ඇති ඔහුගේ දායාදයන් පිළිබඳව ඔවුන් ඊර්ෂ්‍යා කරන්නහිද ? *(අල්කුර්ආන්-4:54)*

## ඊර්ෂ්‍යාව වර්ග දෙකකි.

1-පුද්ගලයෙකු සතු සම්පත් හෝ දැනුම් ඥානය හෝ බලය යන දායාදයන් තමාට ලැබීම සඳහා ඔහුගෙන් ඉවත් විය යුතුයි යනුවෙන් ආශාවීම.

2-පුද්ගලයෙකු සතු දායාදයන් තමාට නොලැබුවද, ඔහුගෙන් ඉවත්විය යුතුයි යනුවෙන් ආශාවීම.

නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[إِيَّاكُمْ وَالْحَسَدَ، فَإِنَّ الْحَسَدَ يَأْكُلُ الْحَسَنَاتِ كَمَا تَأْكُلُ النَّارُ الْحَطَبَ أَوِالْعَشَبَ] (رواه أبو داود)

ඊර්ෂ්‍යා කිරීම ගැන මා ඔබලාට අවවාද කරමි. මක්නිසාදයත්, ගින්න දර මිටිය විනාශ කරන සේම, ඊර්ෂ්‍යාව කුසල් කාර්ය යන් විනාශ කරයි. *(ග්‍රන්ථය : අබුදාවූද්)*

පුද්ගලයෙකු සතුව ඇති දායාදයන් ඉවත්විය යුතුයි යනුවෙන් අපේක්ෂා නොකර, එවන් පුද්ගලයා සතු දායාදයන් තමන්හටද ලැබීමට අපේක්ෂා කිරීම ඊර්ෂ්‍යා නොවන්නේය.

## වංචා කිරීම

මුස්ලිම් වරයා තම සහෝදරයින් අතර විශ්වාසියෙකු ලෙස සිටිය යුතු අතර, කිසියම් කෙනෙකුට හෝ වංචා නොකළ යුතුයි. එනිසා, තමාට කැමැතිවන දේම තම සහෝදරයාටද කැමැතිවිය යුතුයි. මුස්ලිම් ග්‍රන්ථයෙහි වාර්තාවී ඇති පරිදි මුහම්මදු (සල්) තුමා 'කවරෙකු අපව රැවටෙන්නේද ? ඔහු අපේ අයෙකු නොවන් නේය' යනුවෙන් පවසන්නේය.

දිනක් නබි මුහම්මදු (සල්) තුමානන් (කඩ වීදියෙහි) ආහාර ගොඩක යාබදව ගමන් කළ අවස්ථාවේ තම අත එහි ඇතුල් කළ විට එහි තැත ගතිය දැනගත් එතුමා 'ආහාර වෙළෙන්දනී, මෙය කුමක්ද ? යනුවෙන් විමසීය. එයට ඔහු 'අල්ලාහ්ගේ දූතයා නෙනි, වැහි ජලයෙන් එය තැමිත' යනුවෙන් කීය. එවිට එතුමා 'මිනිසුන්ගේ බැල්මට දැනෙන පරිදි එය උඩට දැමිය නොහැකි ද ?' යනුවෙන් අසමින් 'කවරෙකු අපට වංචා කරන්නේද ? ඔහු අපට අයත් අයෙකු නොවන්නේය' යනුවෙන් පැවැසීය. *(ග්‍රන්ථය : මුස්ලිම්)*

# අහංකාර කිරීම

සමහර අවස්ථාවක මිනිසා තම දැනුම් ඥානය පිළිබඳව අහං කාර කරයි. එමගින් ඔහු වෙනත් මිනිසුන්ට හෝ දැනුම් ඥාන වන්තයින්ට හෝ වඩා තමා ශ්‍රේෂ්ඨයා බව සිතා ඔවුන්ව පහත් කමින්ද දකින්නට පටන් ගනී. සමහර අවස්ථාවක මිනිසා තම ධනය ගැන අහංකාර කරයි. මෙමගින් ඔහු තමා අන් මිනිසුන්ට වඩා ශ්‍රේෂ්ඨයා ලෙස සිතයි. එසේම සමහර අවස්ථාවක මිනිසා තම කුසලතා හෝ ඇදහීමයන් හෝ මෙවැන්නන් ගැනද අහං කාර කරමින් සිටින්නේය.

නමුත්, සත්‍ය මුස්ලිම්වරයා මෙවන් අහංකාර කමෙන් වැළකී සිටිමින් ඒ පිළිබඳව අවධානයෙන් සිටී. නිසැකයෙන්ම ෂෙතාන් (යකෂයා) ස්වර්ගයෙන් පිටමන්වීමට හේතුවූයේ ඔහුගේ අහංකා රකම බව මුස්ලිමෙකු සිතයි. එසේම, ආදම් (අලෛ) නබිතුමාට (හිස නමා) සුජූදය කරන ලෙසට අල්ලාහ් ඔහුට අණ කළ විට ඔහු 'මා ඔහුට වඩා ශ්‍රේෂ්ඨයාය. ඔබ මාව දල්වන ගින්නෙන් නිර්මානය කළේය නමුත්, ඔබ ආදම් මැටිවේ පස්වලින්ය' යනු වෙන් කීය. මෙය ඔහු අල්ලාහ්ගේ දායාදයෙන් පිටමන් කිරීමට හේතු වීය. මෙම අහංකාර කමට ඖෂධය වන්නේ, මිනිසෙකු තමාට අල්ලාහ් අදට ලබාදී ඇති දැනුම් ඥානය, ධනය හා ආරෝග්‍ය භාවය වැනි දායාදයන් කිසියම්

මොහොතක හෝ උදුරා ගැනීමට අල්ලාහ් ඉතා ශක්ති වන්තයා බව තේරුම්ගෙන සිටීමකි.

# ගුණධර්මය වර්ධනය කිරීමේ මාර්ග

තම ආත්මයට හුරුවූ ගුණාංග වෙනස් කිරීම මිනිස් ස්වභාව යට ඉතා බරක්වූ කාර්ය යන්නෙහි කිසියම් සැකයක් නොමැත. නමුත් මෙය නොහැකි කාර්යයක්ද නොවන්නේය. එබැවින්, විවිධ කාරණාවන් හා මාර්ගයන් මගින් මිනිසා යහපත් ගුණාංග යන් වර්ධනය කළ හැක. ඒවා මෙසේය.

## 1-සත්‍ය ප්‍රතිපත්තිය

ප්‍රතිපත්තිය විශිෂ්ඨම කරුනක්ය. වැඩි වශයෙන් මිනිසාගේ ගුණාංගයන් ඔහුගේ චින්තනා ප්‍රතිපත්තිය හා ඔහු පිළිපදින ධර්මයෙහි ප්‍රතිබිම්බයක් බව පවතී. එපමණක් නොව, නියත වශයෙන්ම, ප්‍රතිපත්තිය හෙතම විශ්වාසයෙකි.

විශ්වාසීන් අතරෙහි, විශ්වාසයෙහි පරිපූරණ වන්තයා ඔවුන් අතර සිටින සත් ගුණධර්ම ශීලයාය. ප්‍රතිපත්තිය නිසි ලෙස පවතින්නේනම්, එමගින් ගුණධර්මයන්ද යහපත් ශීලයෙන් පවතී. සත්‍ය ප්‍රතිපත්තිය ඔහුට සත්‍ය භාවය, දානය කිරීමේ හැකියාව, ඉවසීම, වීරකම යන සත් ගුණධර්මයන් කෙරෙහි රැකුල් දෙයි. එසේම, අසත්‍ය භාවය,

ලෝභකම නොදැනුවත් කම යන අයහපත් ගුණාංගයන් කෙරෙහි ඔහුව වළක්වයි.

## 2-ප්‍රාර්ථනාව

ප්‍රාර්ථනාව ඉතා විශාලම දොරටුවකි. එය දාසයෙකුට විවෘත වූයේනම්, එම මාර්ගයෙන් කුසල් හා දායාදයන් අඛණ්ඩවම පැමිණමින් පවතී. කවරෙකු යහපත් ගුණධර්මයන් පිළිපැදී මට හා අයහපත් ගුණාංගයෙන් වැළකී සිටීමට අපේක්ෂා කරන්නේද, ඔහු අල්ලාහ් කරා යොමුවිය යුතුයි. ඔහු ඔහුට යහපත් ගුණධර්මයන් වර්ධනය කර, අයහපත් ගුණාංගයන් ඔහුගෙන් ඉවත් කරයි.

මෙම කරුණු මත හා වෙනත් කාරණා අනුව ප්‍රාර්ථනා කිරීම ඉතා ප්‍රයෝජන දායකය. මෙනිසා නබි මුහම්මදු (සල්) තුමා තම දෙවියා වෙත ඉතා කීකරුවෙන් තමාට යහපත් ගුණධර් මයන් ලබා දෙන ලෙස අධිකව ප්‍රාර්ථනා කරන්නේය. එතුමා සලාතයේ ආරම්භක ප්‍රාර්ථනාවේදී මෙසේ ප්‍රාර්ථනා කරමින් සිටින්නේය.

[اَللَّهُمَّ اهْدِنِيْ لأَحْسَنِ اْلأَخْلاَقِ ، لاَ يَهْدِيْ لأَحْسَنِهَا إِلاَّ أَنْتَ ، وَاصْرِفْ عَنِّيْ سَيِّئَهَا، لاَ يَصْرِفُ عَنِّيْ سَيِّئَهَا إِلاَّ أَنْتَ] (رواه مسلم)

දෙවියනේ, සත් ගුණධර්මයන් කරා මාහට සුමග පෙන්වනු මැනවි. සත් ගුණධර්මයන් කරා මාහට සුමග පෙන්වන්නා ඔබ හැර අන් කිසිවෙකු

නොමැත. අයහපත් ගුණාංගයන් මගෙන් ඉවත් කරනු මැනවි. අයහපත් ගුණාංගයන් මගෙන් ඉවත් කරන්නෙකු ඔබ හැර අන් කිසිවෙකු නොමැත.

*(ග්‍රන්ථය : මුස්ලිම්)*

## 3-සටන් කිරීම

මෙම කාර්යයෙහි සටන් කිරීම පලදායක කරුණෙකි. සත් ගුණධර්මයන් පිළිපැදීමටත්, අයහපත් ගුණාංගයෙන් වැළකී සිටීමටත් තම සිත්සතන් සමග කවරෙකු සටන් කරන්නේද, ඔහුට අධික කුසල් ලැබෙන අතර, ඔහු වටා පිරිවරාමින් ඇති අකුසල් ඉවත්වේ.

යහපත් ගුණ ධර්මයන් අතර ස්වභාවික හා උනන්දුවෙන් තමා වර්ධනය කරගන්නා යහපත් ගුණාංගයන් ඇත. සටන් කිරීම යනුවෙන් හැඳින්වන්නේ, පුද්ගලයෙකු තම සිත්සතන් සමග වරක් හෝ දෙවරක් හෝ කීප වතාවන් හෝ සටන් කිරීමක් නොවේ. නමුදු, සටන් කිරීම යනු මරණය දක්වාම සටන් කිරීමකි. මක්නිසාදයත්, සටන් කිරීම ඇදහීමයෙකි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَاعْبُدْ رَبَّكَ حَتَّى يَأْتِيَكَ الْيَقِيْنُ﴾ [الحجر:٩٩]

ඔබට මරණය සිදුවන තෙක් ඔබ දෙවියාව අදහන්න.

*(අල්කුර්ආන්-15:99)*

## 4-ස්ව පරීක්ෂා කිරීම

තම අයහපත් ගුණාංග කෙරෙහි එහි නිවැරදි භාවය ගැන තමා විසින්ම ස්වපරීක්ෂා කළ යුතු අතර, නැවත වරක් මෙම ගුණාංගයෙහි නොයෙදීමට අධිටන් කළ යුතුයි.

## 5-සත් ගුණධර්ම මගින් සිදුවන කුසල් ගැන සිතීම

නියත වශයෙන්ම, සමහර කාර්යයන්හි පල ප්‍රයෝජනයන්
පිළිබඳව දැන සිටීම හා එහි අවසාන යහපත් තීරණය ගැන සිතුවිලිමත් වීම, ඒවා ක්‍රියා කිරීමටත් පිළිපැදීමටත් ඒ වෙනු වෙන් උනන්දු වීමටත් ඉමහත් හේතු දායක වන්නේය.

## 6-අයහපත් ගුණාංගයෙහි අවසානය ගැන සිතීම

එනම්, අයහපත් ගුණාංගය මගින් සිදුවන ස්ථිර කණගාටුව, අඛණ්ඩ ශෝකය, හානිය, දුක හා මිනිසුන්ගේ සිත් සතන් තුල සිදුවන අසතුට යනාදියන් ගැන සිතා බැලිය යුතුයි.

## 7-සිත පදම් කිරීමෙහි අවිශ්වාස නොකිරීම

අවිශ්වාස කිරීම මුස්ලිම් වරයාට යහපත් නොවන අතර, එය කිසිදු දිනක හෝ ඔහුට සුදුසුද නොවන්නේය. නමුත්, තම ඇල්ම ශක්තිමත් කර සිත්සතන පරිපූරණ කිරීමට හා තම අඩුපාඩු නිවැරදිකර ගැනීමට උත්සාහ කිරීම අවශ්‍යවේ.

## 8-මුහුණ ප්‍රබෝධවීම හා අප්‍රසන්නවීමෙන් වැළකීම

පුද්ගලයෙකු තම සහෝදර මුස්ලිම්වරයාව මුහුණේ ප්‍රබෝධ යෙන් බැලීම දානයෙකි. එයට කුලියද ලැබේන්නේය. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

**[تَبَسُّمُكَ فِيْ وَجْهِ أَخِيْكَ صَدَقَةٌ]** (أخرجه الترمذي)

ඔබ ඔබේ සහෝදරයාව මුහුණේ ප්‍රබෝධයෙන් බැලීම ඔබට දානයෙකි.

*(ග්‍රන්ථය : තිර්මිදි)*

**[لاَ تَحْقِرَنَّ مِنَ الْمَعْرُوْفِ شَيْئًا وَلَوْ أَنْ تَلْقَى أَخَاكَ بِوَجْهٍ طَلِقٍ]** (رواه مسلم)

ඔබ සහෝදරයාව මුහුණේ ප්‍රබෝධයෙන් හමුවීම ඇතුලු කිසි යම් යහපත් කාර්යයක්ද ඔබ ස්වල්ප ලෙස නොසිතන්න.

*(ග්‍රන්ථය : මුස්ලිම්)*

## 9-නොදිටීම හා නොසැළකීම

මෙම ගුණාංග දෙක උගතුන් හා ශ්‍රේෂ්ඨයන්ගේ ගුණාංග වේ. මෙය ආදරය වර්ධනය කිරීමටත් එය අඛණ්ඩව පවත්වා ගෙන යාමටත්, විරෝධී භාවය වළලීමටත් සහායවේ.

## 10-ඉවසීම

ඉවසීම ගුණාංගයන් අතර ඉතා උතුම් හා ඥාන වන්තයන්ට සුදුසු සත් ගුණධර්මයෙකි. ඉවසීම යනුවෙන් හැඳින්වන්නේ, කෝපය නැගෙනවිට සිත මෙල්ල කිරීමකි. නමුදු, ඉවසිලි වන්තයා කෝප නොවී සිටීම ඉවසීමෙහි කොන්දේසියක් නොවන්නේය. ඔහු කෝපය නැගෙන විට තම ඉවසිලි භාව යෙන් එය මෙල්ල කරයි. කෙනෙකු ඉවසිලි භාවයෙන් සිටින් නේනම්, ඔහුට ආදරය දක්වන්නන් අධික වන අතර, ඔහුව අප්‍රිය කරන්නන් අඩුවේ. ඔහුගේ තරාතිරමද උසස්වේ.

## 11-නුගතුන්ගෙන් ඉවත්වීම

කවරෙකු හෝ නුගතුන්ගෙන් ඉවත්වී සිටින්නේද, ඔහු තම නම්බුව රැකගෙන සිත්සතනට සැනසීම ලබා ගනී. එසේම තමාට බාධා කරන දේ කෙරෙහි සවන්දීමෙන් වැළකී සිටී. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿خُذِ الْعَفْوَ وَأْمُرْ بِالْعُرْفِ وَأَعْرِضْ عَنِ الْجَاهِلِيْنَ﴾ [الأعراف:١٩٩]

(නබිතුමනි) සමාවනීය භාවය අනුගමනය කරන්න. කුසල් (කාර්යයන්) පිළිපදින මෙන් අණ කරන්න. නුගතුන්ගෙන් වැළකී සිටින්න. *(අල්කුර්ආන්-7:199)*

## 12-බැණවැදීමෙන් වැළකීම

මිනිසුන්ට බැණ වැදීමෙන් වැළකී සිටීම සත් ගුණධර්මයකි.

## 13-පීඩාවන් අමතක කිරීම

ඔබට හිරිහැර කළ අය කෙරෙහි ඔබේ සිත පවිත්‍රවීම සඳහා එම හිරිහැරයන් අමතක කළ යුතුයි. ඔහුව අන් අය ලෙස නොසැළකිය යුතුයි. මක්නිසාදයත්, තම සහෝදරයන් කළ හිරිහැරයන් අමතක නොකර ඒවා සිහිකර සිටින්නාට ඔවුන් සමග උතුම් ජීවිතයක් ගත කළ නොහැක. එබැවින්, හැකි තාක් එම හිරිහැරයන් අමතක කළ යුතුයි.

## 14-සමාවීම හා අකුසල් කරන්නාට කුසල් කිරීම

මෙසේ කිරීම තරාතිරම උසස්වීමට හේතු වන්නේය. තමාගේ සිතට මෙයින් සැනසීමද පළිගැනීමේ චේතනාවෙන් නිදහස්ද ලැබෙන්නේය.

## 15-දානය කිරීම

දානය කිරීම උතුම් ගුණධර්මයෙකි. ලෝභකම නින්දාව ඇති කරන සේම, දානය කිරීම ආදරය ඇති කරයි. අසතුට ඉවත් කරයි. යහපත් කීර්ති නාමය ලබාදී අඩුපාඩුකම හඟවයි.

## 16-අල්ලාහ්ගේ කුලිය සත්‍ය බව සිතීම

යහපත් ගුණධර්මයන් වර්ධනය කිරීමට සහායවන කාර්ය යන් අතර උතුම් කාර්ය අල්ලාහ්ගේ කුලිය කෙරෙහි විශ්වාස කිරීමකි. මෙය ඉවසීම, සිත් සතන් සමග සටන් කිරීම හා මිනිසුන්ගේ හිරිහැරයන් ඉවසා සිටීම යනාදීන් සඳහා සහාය වන්නේය. කවරෙකු තම සත් ගුණධර්මයන්ට හා සිත් සතන් සමග කරන සටනට නිසැකව, අල්ලාහ් කුලිය පිරිනමන බව ස්ථිරයෙන් විශ්වාසය කරන්නේද, ඔහු සත් ගුණධර්ම යන් වර්ධනයකර ගැනීමට උනන්දුව දක්වයි. මෙම මගෙහි ඔහු මුහුණපාන කරුණු සියල්ල ඔහුට පහසුවෙන් පවතී.

## 17-කෝපවීමෙන් වැළකීම

නියත වශයෙන්ම, කෝපවීම සිත්සතන් තුල දැල්වන ගින් නෙකි. මෙය දඬුවම් කිරීමටත්, පළි ගැනීමටත් උසිගන්වයි. මිනිසා කෝපයට පත්වනවිට තම සිත්සතන මෙල්ලකර ගත් තේනම්, ඔහු තම ආත්ම ගෞරවය හා ගරුත්වය රැක ගනී. නිදහසට කරුණු සෙවීමේ නින්දාවෙන් හා දුකෙන් තමාව වළක්වා ගනී.

අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[جَاءَ رَجُلٌ فَقَالَ : يَارَسُوْلَ اللهِ ، أَوْصِنِيْ فَقَالَ : لاَ تَغْضَبْ، ثُمَّ رَدَّدَ مِرَارًا، فَقَالَ: لاَ تَغْضَبْ] (رواه البخاري)

මිනිසෙකු පැමිණ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මාහට උපදෙස් කරන්න' යනුවෙන් නබි තුමාගෙන් විමසූකළ එතුමා 'කෝප නොවන්න' යනුවෙන් උපදෙස් කළේය. ඔහු නැවත නැවත උපදෙස් කරන මෙන් විමසීය. එවිටද 'ඔබ කෝප නොවන්න' යනුවෙන් එතුමා පැවැසීය. *(ග්‍රන්ථය : බුහාරි)*

## 18-උපදෙස් හා විමර්ශන පිළිගැනීම

තම අඩුපාඩුවන් පෙන්වා දෙනවිට එයින් වැළකී සිටීම සඳහා ඒවා පිළිගැනීම ඔහුට අනිවාර්යවේ. මක්නිසාදයත්, තමාගේ අඩුපාඩුවන් නොදැනෙන බව රැගපෑම මගින් සිත ශීලාචාර කිරීමට නොහැක. එනිසා අර්ථවත් උපදෙස් හා සාර්ථකවත් විමර්ෂන පිළිගත යුතුයි.

## 19-පවරන කාර්ය පරිපූර්ණයෙන් ඉටුකිරීම

මෙමගින් නින්දාව, තර්ජනය, නිදහසට කරුණු කීම සහ පහත්කම යනාදීන්ගෙන් වැළකීමට හැක.

## 20-වරද පිළිගැනීම හා එය සාධාරණය කිරීමෙන් වැළකීම

මෙය යහපත් ගුණධර්මයේ සළකුනක් වන අතර, අසත්‍යය ප්‍රකාශ කිරීමෙන්ද වළක්වයි. වරද පිළිගැනීම ගුණධර්මයකි. මෙම ගුණාංගය මෙවැන්නන්ගේ ගෞරවය ශ්‍රේෂ්ඨ කරයි.

## 21-සත්‍යභාවය වෙළාගැනීම

නියත වශයෙන්ම, සත්‍ය භාවයට විශිෂ්ඨ පල ප්‍රයෝජනයන් තිබේ. මෙමගින් පුද්ගලයෙකුගේ තරාතිරම හා ගෞරවය ශ්‍රේෂ්ඨවේ. මෙම ගුණාංගය අසත්‍ය නම්වූ කිලිටුවෙන්ද, සිත් තැවුලෙන්ද හා සාදාරණය කිරීමේ නින්දාවෙන්ද රැක ගනී. එම සත්‍ය භාවය ඔහුට ගෞරවය, වීරකම, නම්බුව යනාදීන් ලබා දෙන සේම, මිනිසුන් ඔහුට අපරාධ කිරීමෙන්ද, ඔහුගේ නම්බුවට හානි කිරීමෙන්ද ඔහුව ආරක්ෂා කරයි.

## 22-නින්දා කිරීමෙන් හා පරුෂ වචන කීමෙන් වැළකීම

අධික නින්දා කිරීම කෝපය උසිගන්වයි. විරුද්ධතාවය ඇති කරයි. කරදරයන් සිදුකරන දේ කෙරෙහි සවන්දීමට යොමු කරයි. එහෙයින්, සත්‍ය වන්තයා කුඩා හෝ ලොකු කිසියම් වරද්දක් සඳහා හෝ තමාගේ සහෝදරයාට (නින්දිත ලෙස හෝ පරුෂ වචනයෙන් හෝ) අවවාද නොකරයි. 'ඔහු එසේ කර ඇත්තේ, කුමක් හෝ හේතුවක් නිසා විය හැක' යනු වෙන් සිතයි. අවවාද කළම යුතුනම්, සිනිඳු භාවයෙන් අව වාද කරයි.

## 23-උගතුන් හා යහපතුන් සමග මිත්‍රත්වය පවත්වීම

උගතුන් හා යහපතුන් සමග මිත්‍රත්වය පවත්වීම යහපත් ගුණධර්මයන් පුහුණු කිරීමටත්, එය

සිත්සතන් තුල තැන් පත් කිරීමටත් ඉමහත් ශ්‍රේෂ්ඨම මාර්ගයෙකි.

## 24-සාකච්ඡා හා සභා පිළිවෙල් පිළිපැදීම

සාකච්ඡාවෙහි අදහස් යොමු කරන්නාගේ කතා බහවලට සවන්දීම, ඔහුගේ කතාව විසන්ධි කිරීමෙන් හෝ අසත්‍ය කිරීමෙන් හෝ එය අල්පවත් ලෙස සිතීමෙන් හෝ ඔහු තම කතාව අවසන් කිරීමට පෙර නැගිට්ට යාමෙන් හෝ වැළකී සිටීම අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු පිළිවෙල්ය. එසේම, සභාව තුල පිවිසනවිට හා සභාවෙන් පිටත්වනවිට සලාම් කීම, සභාවෙහි අන් අය වෙනුවෙන් ස්ථානය විශාල කිරීම, කෙනෙකු නැගිට්ටවා ඒ ස්ථානයේ තමා අසුන් නොගැනීම, දෙන්නා අතර ඔවුන්ගේ අනවසරයෙන් අසුන් නොගැනීම, තුන්දෙනා සිටින කළ දෙන්නා සමග පමණක් පෞද්ගලිකව රහස් කතා නොකිරීම යනාදීන්ද සභාවෙහි පිළිවැල්ය.

## 25-නබිතුමාගේ චරිත කතාව අඛණ්ඩව කියවීම

නබිතුමාගේ ජීවිත චරිතය කියවන්නන්ට මිනිස් සංහතිය නුදුටු ඉතා උතුම් ආදර්ශයන්ද, මිනිස් ජීවිත යට පරිපූරණ මග පෙන්වීම්ද, යහපත් ගුණධර්මයන්ද ලබා දෙන්නේය.

## 26-සහාබාවරුන්ගේ ජීවිතය ගැන අවධානය යොමු කිරීම

## 27-ගුණධර්මය පිළිබඳ පොත්පත් කියවීම

නිසැකයෙන්ම, මෙවන් පොත්පත් කියවීම මිනිසාට යහපත් ගුණධර්මයන් කෙරෙහි උනන්දුව දක්වයි. එහි විශේෂය සිහි ගන්වයි. එම ගුණාංගයන් වර්ධනයකර ගැනීම සඳහා ඔහුට සහාය දක්වයි. එසේම,එම පොත්පත් අයහපත් ගුණාංගයන් ගැන ඔහුට අවවාද කරයි. එහි අවසාන (පිළිකුල්) තීන්දුව කෙරෙහි වැළක්වීමට අයත් මග පෙන්වීම් ඔහුට පැහැදිලි කරයි.

යා අල්ලාහ්, ඔබ අණකළ හා
නබිතුමා ආදර්ශමත් කළ
යහපත් ගුණධර්ම පෙන්වනු මැන
අප සැමට .......

وصلى الله على نبينا محمد وعلى آله وصحبه وسلم.